දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය - 2014

---

දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව අතර 2006 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී 87 දරන ණය ගිවිසුමේ 4(8) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය, වර්තමානයේ මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය (මාසඅ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, නැගෙනහිර පළාතේ ඌන සංවර්ධිත ප්‍රාදේශීය ආර්ථිකයේ ආර්ථික පදනම ප්‍රතිස්ථාපනය කිරීම සහ මඩකලපුවේ නව කල්ලඩි පාලම ඉදිකිරීම ඇතුළත්ව අක්කරෙයිපත්තු සිට තිරුක්කොන්ඩයිමඩු දක්වා හානියට පත්වූ හා අර්ධ වශයෙන් සුනාමි බලපෑමට ලක්වූ ජාතික මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම මඟින් ව්‍යාපෘති ප්‍රදේශය ඇතුළත හා බාහිර ප්‍රවේශය වැඩිදියුණු කිරීමෙන් ප්‍රාදේශීය ආර්ථික අසමානතා අඩුකිරීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 4,460 ක් විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2010 සැප්තැම්බර් වන විට නිම කිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2013 සැප්තැම්බර් 15 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති කටයුතු 2014 දෙසැම්බර් 31 දක්වා දිගටම පවත්වා ගෙන ගොස් තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි

ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඇ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඈ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය
---------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

අක්කරෙයිපත්තු සිට තිරුක්කොන්ඩයිමඩු දක්වා මාර්ග ප්‍රතිසංස්කරණ වැඩ සහ නව කල්ලඩි පාලම ඉදිකිරීම නිමකර පිළිවෙලින් 2010 දෙසැම්බර් 30 දින හා 2013 සැප්තැම්බර් 15 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණද ඒ සඳහා දරන ලද රු.මිලියන 6,596 ක මුළු පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ ලෙස අඛණ්ඩව දක්වා තිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
-------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
----------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | රුපියල් මිලියන | ජපන් යෙන් මිලියන | රුපියල් මිලියන |
| ජාසජබැ | 4,460 | 6,158 | - | - | 4,837 | 6,205 |
| ශ්‍රී ලං ර | - | 1,532 | 82.91 | 82.91 | - | 1,111 |
| එකතුව | 4,460 | 7,690 | 82.91 | 82.91 | 4,837 | 7,316 |

3.2 භෞතික ප්‍රගතිය

අක්කරෙයිපත්තු සිට තිරුක්කොන්ඩයිමඩු දක්වා ජාතික මාර්ග කිලෝමීටර 100 ක් ප්‍රතිසංස්කරණය කිරීම සහ කල්ලඩි නව පාලම ඉදිකිරීම සඳහා රු.මිලියන 3,806.80 ක ඇස්තමේන්තුගත පිරිවැයකට විදේශිය කොන්ත්‍රාත්කරුවකුට 2007 නොවැම්බර් 09 දින ප්‍රදානය කර මාස 30 ක් ඇතුළත නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද විදේශිය කොන්ත්‍රාත්කරු විසින් ජාතික මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම පමණක් මාස 06 ක ප්‍රමාදයක් සහිතව 2010 දෙසැම්බර් මාසයේදී නිම කර තිබූ අතර ඒ සඳහා රු.මිලියන 3,102.88 ක මුදලක් වැයකර තිබුණි. එබැවින් නව පාලම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු.මිලියන 813.47 ක ඇස්තමේන්තුගත පිරිවැයකට රාජ්‍ය සංස්ථාවකට නැවත ප්‍රදානය කර තිබූ අතර 2012 ජනවාරි 08 දින වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණි. පාලම ඉදිකිරීම් වැඩ රු.මිලියන 1,113.72 ක පිරිවැයකට වර්ෂ 1 1/2 ක ප්‍රමාදයක් සහිතව 2013 සැප්තැම්බර් මාසයේදී නිම කර තිබුණි. එබැවින් ජාතික මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා පාලම ඉදිකිරීම සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 409.80 ක අතිරේක මුදලක් දරා තිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන කරුණු

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාර්යයන් මත කොන්ත්‍රාත්කරු විසින් උපයන ලද ලාභ මත එකතුව රු.මිලියන 9.22 ක ආදායම් බදු ගෙවා තිබුණු අතර එය ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. තවද උපදේශකගේ පාරිශ්‍රමික මත ව්‍යාපෘතිය විසින් ගෙවන ලද රු.මිලියන 16.55 ක්වූ උපයන විට ගෙවීම් බදු අයකර ගෙන නොතිබුණි.